| | | |
|---|---|---|
| කෘෂි හා ආහාර තාක්ෂණය - I | 10 ශ්‍රේණිය | කාලය පැය එකයි |

## I පත්‍රය

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. ශ්‍රී ලංකාවේ ඉදි කල ප්‍රථම වැව,
   - i) බසවක්කුලම වැවයි.
   - ii) පරාක්‍රම සමුද්‍රයයි.
   - iii) තිසා වැවයි.
   - iv) කලා වැවයි.

2. වැවකින් වගාවට ජලය නිකුත් කරන ප්‍රධාන ස්ථානය වනුයේ,
   - i) පිටවානයි.
   - ii) රළ පනාවයි.
   - iii) සොරොව්වයි.
   - iv) බිසෝ කොටුවයි.

3. පහත සඳහන් ප්‍රකාශ අතීත ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය පිළිබඳව වේ.
   - A. කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන යාමට යෝධ ඇල සකස් කරන ලදී.
   - B. යෝධ ඇල සකස් කරන ලද්දේ මහසෙන් රජතුමා විසිනි.
   - C. අහසින් වැටෙන එක දිය බිඳක්වත් අපතේ නොයවා ප්‍රයෝජනයට ගත යුතුය යන සංකල්පය පණ්ඩුකාභය රජතුමාගේය.

   ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,
   - i) A පමණි
   - ii) B පමණි
   - iii) B හා C පමණි
   - iv) A හා B පමණි

4. වර්තමාන ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය,
   - i) 50%කි
   - ii) 28%කි
   - iii) 19%කි
   - iv) 12%කි

5. කෘෂි කර්මාන්තයට අයත් ප්‍රධානම ක්ෂේත්‍ර වනුයේ,
   - i) බෝග වගාව හා පශු සම්පත් පාලනයයි
   - ii) පශු සම්පත් පාලනය හා ධීවර කර්මාන්තයයි
   - iii) බෝග වගාව හා වාරි කර්මාන්තයයි
   - iv) ධීවර කර්මාන්තය හා වන වගාවයි

6. වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට හිතකර ලෙස ක්‍රියා කරන වඩාත් වැදගත් රාජ්‍ය ප්‍රතිපත්තිය වනුයේ,

   i) වගාවන්ට වාරි ජලය ලබා දීමයි
   ii) වගාව සඳහා අවශ්‍ය බීජ ලබා දීමයි
   iii) වගාව සඳහා පොහොර සහනාධාර ලබා දීමයි
   iv) වගාව සඳහා විවිධ කෘෂි රසායන ද්‍රව්‍ය ලබා දීමයි

7. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැවිලි බෝග වන තේ, පොල් හා රබර් සඳහා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවා ඇත්තේ පිළිවෙලින්,

   i) ලුණුවිල, තලවකැලේ හා අගලවත්තේ ය.
   ii) තලවකැලේ, ලුණුවිල හා අගලවත්තේ ය.
   iii) අගලවත්ත, ලුණුවිල හා තලවකැලේ ය.
   iv) අගලවත්ත, තලවකැලේ හා ලුණුවිල ය.

8. යුරෝපීය ආක්‍රමණ නිසා මෙරට යැපුම් කෘෂිකර්මාන්තය විනාශ විය. යැපුම් කෘෂිකර්මාන්තයේ ප්‍රධානතම ලක්ෂණයකි,

   i) විශාල වගා බිම් පවත්වා ගැනීම
   ii) අත්තම් ක්‍රමයට වගා කිරීම
   iii) රසායනික පොහොර භාවිතා කිරීම
   iv) වගා බිමේ කටයුතු සඳහා යන්ත්‍ර භාවිතා කිරීම

9. ශ්‍රී ලංකාව බෙදා ඇති කෘෂි දේශගුණික කලාප සංඛ්‍යාව,

   i) 3 කි    ii) 7 කි    iii) 24 කි    iv) 46 කි

10. ශ්‍රී ලංකාව කෘෂි දේශගුණික කලාපවලට බෙදීමේදී සලකා බලා ඇති ප්‍රධානම සාධක වනුයේ,

   i) වාර්ෂික වර්ෂාපතනය පමණි.
   ii) උච්චත්වය පමණි.
   iii) වාර්ෂික වර්ෂාපතනය හා උච්චත්වයයි
   iv) වාර්ෂික වර්ෂාපතනය, උච්චත්වය හා වගා කර ඇති බෝගයයි.

11. කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාවය මැනීම සඳහා භාවිතා කරනුයේ,

   i) සාමාන්‍ය උෂ්ණත්වමානයයි
   ii) උපරිම හා අවම උෂ්ණත්වමානයයි
   iii) සූර්ය විකිරණ සටහන් මානයයි
   iv) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානයයි

12. ශ්‍රී ලංකාවේ වර්ෂාපතන රටාවට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i) මාර්තු අප්‍රේල් - පළමුවන සංවහන වැසි සමය වේ.

ii) මැයි සිට සැප්තැම්බර් දක්වා ඊසාන දිග මෝසම් වැසි ඇතිවේ.

iii) දෙසැම්බර් සිට ජනවාරි දක්වා දෙවන සංවහන වැසි සමය වේ.

iv) ඔක්තෝම්බර් මාසයේ නිරිත දිග මෝසම් වැසි ආරම්භ වේ.

13. යල කන්නයට අයත් මාස වනුයේ,

i) ඔක්තොම්බර් සිට පෙබරවාරි දක්වා වේ.

ii) අගෝස්තු සිට දෙසැම්බර් දක්වා වේ.

iii) මාර්තු සිට අගෝස්තු දක්වා වේ.

iv) මැයි සිට ඔක්තෝම්බර් දක්වා වේ.

14. ප්‍රභාසංස්ලේෂණ වේගය වැඩි කර ශාකයේ අස්වැන්න වැඩි කිරීමට හිතකර ආලෝකයේ වර්ණ වනුයේ,

i) රතු හා කොළ ආලෝකයයි

ii) නිල් හා කොළ ආලෝකයයි

iii) කහ හා නිල් දම් ආලෝකයයි

iv) නිල් හා රතු ආලෝකයයි

15. නිරිත දිග මෝසම් සුළං කාලයේ සුළං දිශා දර්ශකයක ඊ හිස හැරී ඇත්තේ,

i) නිරිත දිශාවට වේ

ii) ඊසාන දිශාවට වේ.

iii) බටහිර දිශාවට වේ.

iv) නැගෙනහිර දිශාවට වේ.

16. එක්තරා දිනයක උදෑසන කාලයේ පැහැදිලි අහසක් දැකිය හැකි වූ අතර මධ්‍යාහ්නය වන විට කැටි කලාකුළු ඇති වී සතස් කාලය වන විට ගිගුරුම් සහිත වැසි ඇති විය. ඉහත ආකාරයට ඇතිවෙන වැසි හඳුන්වනු ලබන්නේ,

i) සංවහන වැසි ලෙසයි

ii) චාසුලි වැසි ලෙසයි

iii) මෝසම් වැසි ලෙසයි

iv) කඳු වැසි ලෙසයි

17. DL ලෙස හඳුන්වන කෘෂි දේශගුණික කලාපයේ වාර්ෂික වර්ෂාපතනය විය හැක්කේ මිලි මීටර්

i) 1750 ට අඩු අගයකි

ii) 2500 - 3000ත් අතර අගයකි

iii) 1750 ත් 2500 ත් අතර අගයකි

iv) 3000 - 5000 අතර අගයකි

18. ආග්නේය පාෂාණ ඇති වීමේ ක්‍රියාවලිය,

i) කුඩා ඛනිජ අංශු ගසා ගෙන ගොස් ගැන්වීමයි

ii) පෘථිවිය මධ්‍යයේ දී අධික උෂ්ණත්වය හා පීඩනයට භාජනය වීමයි

iii) පෘථිවියේ ඇතිවන භූ චලන නිසා පාෂාණ පෘථිවිය තුළට කිඳා බැසීමයි

iv) මැග්මා තරලය පෘථිවියේ දුර්වල තැන් වලින් පිටතට පැමිණ සිසිල් වීමයි.

19. වියළි පස් සාම්පලයක් සිදුරු විශ්කම්භය මිලි මීටර් 0.002 වූ පෙනේරයකින් හැලූ විට පෙනේරය මත ඉතිරි වන පාංශු ඛනිජ අංශු වනුයේ

i) මැටි හා සියුම් වැලි අංශු වේ

ii) මැටි, සියුම් වැලි හා රළු වැලි අංශු වේ.

iii) මැටි අංශු පමණි

iv) සියුම් වැලි හා රළු වැලි අංශු පමණි.

20. බෝග වගාවට සුදුසු පසක පැවතිය යුතු පාංශු වාතය ප්‍රතිශතය

i) 5% කි ii) 10% කි iii) 25% කි iv) 50% කි

21. ද්ර්ශීය පාංශු පැතිකඩක පෘථිවි පෘෂ්ඨයේ සිට පහලට දැකිය හැකි කලාප පිළිවෙලින්

i) R, C, B, A හා O වේ

ii) O, A, B, C හා R වේ

iii) A, B, C, R හා O වේ

iv) R, A, B, C හා O වේ

22. පාංශු මහා ජීවියෙකි

i) ශාක මුල

ii) බැක්ටීරියා

iii) නෙමටෝඩාවන්

iv) ප්‍රොටොසොවාවන්

23. ශිෂ්‍යයෙක් පස් සාම්පලයක් ගෙන එයට ජලය යොදා ගුලියක් සෑදීමට උත්සහ කළ ද ගුලියක් ලෙස සකස් කර ගත නොහැකි විය. එම පසේ පාංශු වයනය

i) මැටි ලෝම වේ

ii) මැටි වේ

iii) වැලි ලෝම වේ

iv) වැලි වේ

24. කාබනික ද්‍රව්‍ය වියෝජනයේ අවසාන ඵලය,

i) මැටි අංශු වේ

ii) ශාක පෝෂක වේ

iii) හියුමස් වේ

iv) කොම්පෝස්ට් වේ

25. පසක ගුරුත්වාකර්ෂණ ජලය අඩංගු වනුයේ,

i) ක්ෂේත්‍ර ධාරිතා මට්ටමේ දීය

ii) පස සංතෘප්ත මට්ටමට පැමිණි විටදීය

iii) තාවකාලික මැලවීම අවස්ථාවේදීය

iv) ස්ථිර මැලවීම අවස්ථාවේදීය

26. පාංශු ආම්ලිකතාවය ඉවත් කර ගැනීමට පසට යෙදිය හැකි ද්‍රව්‍යයකි

i) ගෙන්දගම්

ii) කාබනික ද්‍රව්‍ය

iii) $(NH_4)_2SO_4$

iv) ඩොලමයිට්

27. පස් අංශු එකිනෙකින් වෙන්වීම අවම කිරීමට යොදා ගත හැකි උපක්‍රමයක් වනුයේ,

i) පස මත ආවරණ බෝග වගා කිරීමයි
ii) පාංශු ව්‍යුහය දියුණු කිරීමයි
iii) සමෝච්ඡ කානු යෙදීමයි
iv) හෙල්මලු ආකාරයට භූමිය සැකසීමයි

28. පොල්සියේ කුලයට අයත් බෝග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

i) වී, උඳු, මුං, කඩල හා කුරක්කන්
ii) වම්බටු, මිරිස්, බඩ ඉරිඟු, උඳු හා වී වේ.
iii) වී, බඩ ඉරිඟු, කුරක්කන්, ඉඳල් ඉරිඟු හා මෙනේරි වේ.
iv) කරවිල, වැටකොලු, මිරිස්, බටු හා වී වේ.

29. සත්‍ය ප්‍රකාශය තෝරන්න.

i) ඔකිඩ් හා ජර්බෙරා යනු විසිතුරු පත්‍රික ශාක වේ.
ii) ගම්මිරිස්, කුරුඳු හා එනසාල් ප්‍රධාන වැවිලි බෝග වේ.
iii) උඳු, මුං, කව්පි යනු මාෂ බෝග වේ.
iv) ග්ලිරිසීඩියා යනු ආවරණ බෝගයකි.

30. බෝගයක් සිටුවූ පසු පසට සිදු කරනු ලබන සියලු කාර්යයන් හඳුන්වනු ලබන්නේ,

i) පශ්චාත් සාත්තු වශයෙනි
ii) ප්‍රාථමික බිම සැකසීම වශයෙනි
iii) ද්විතියික බිම සැකසීම වශයෙනි
iv) අතුරු යත් ගෑම වශයෙනි

31. බෝග සංස්ථාපනයේදී ශාක පේලි අතර පරතරය තීරණය කරනු ලබන්නේ,

i) අස්වැන්න නෙළීමට ගතවන කාලය මතය.
ii) අපේක්ෂිත අස්වැන්න මත වේ.
iii) මූල මණ්ඩලයේ ගැඹුර මත වේ.
iv) ශාකයේ අතු හා පත්‍ර පැතිරෙන දුර මතවේ.

32. තැටි නඟුල

i) යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන ද්විතියික බිම සැකසීමෙ උපකරණයකි
ii) යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන ප්‍රාථමික බිම සැකසීමේ උපකරණයකි
iii) සත්ත්ව ශ්‍රමයෙන් ක්‍රියා කරන ද්විතියික බිම සැකසීමේ උපකරණයකි
iv) යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන පශ්චාත් බිම සැකසීමේ උපකරණයකි.

33. ජපන් වල් පැල නෙලනය අතුරු යත් ගෑම සඳහා භාවිතා කරනු ලැබේ. එය යොදා ගනු ලබන්නේ,

i) වී වපුරන ලද කුඹුරු වල වල්පැල නෙලීමටයි

ii) පේළියට ගොයම් පැල සිටවූ කුඹුරක වල් පැල නෙලීමටයි

iii) ඕනෑම බෝගයක් වගා කළ වගා බිමක වල් පැල නෙලීමටයි

iv) වල් පැලෑටි වල වායව කොටස් කපා දැමීමටයි

34. වම්බටු බෝගය සිටුවීමේදී පේළි අතර පරතරය හා පේළිය තුළ පැල අතර පරතරය පිළිවෙලින් සෙන්ටි මීටර්,

| | |
|---|---|
| i) 90 x 90 වේ. | iii) 90 x 30 වේ. |
| ii) 90 x 60 වේ. | iv) 60 x 45 වේ. |

35. උස් තවාන් පාත්තියෙන් පිහිටි බිමෙහි මට්ටමට වඩා සෙන්ටි මීටර් 15ක් උසට පාත්තිය සකස් කරනු ලබන්නේ,

i) තවාන නඩත්තු කිරීම පහසුවටයි

ii) තවාන් පැල වලට අවශ්‍ය සියුම් පාංශු පරිසරය ලබා දීමටයි

iii) මුල් මණ්ඩලයේ වර්ධනයට ප්‍රමාණවත් ගැඹුරක් ලබා දීමටයි

iv) රෝග පලිබෝධ වලින් තවාන්  පැල ආරක්ෂා කර ගැනීමටයි

❖ **36 සිට 38 දක්වා ප්‍රශ්න පහත බෝග මත පදනම් වේ.**

| | | | |
|---|---|---|---|
| A - මිරිස් | B - කරවිල | C - තක්කාලි | D - වට්ටක්කා |

36. උස් තවාන් පත්ති වල තවාන් දමනු ලබන බෝග වනුයේ,

| | |
|---|---|
| i) A හා B පමණි | iii) B හා C පමණි |
| ii) A හා C පමණි | iv) C හා D පමණි |

37. නෙරිදොකෝ තවානක් භාවිතයෙන් තවාන් පැල ලබාගත යුතු බෝග වූයේ,

| | |
|---|---|
| i) A හා B ය | iii) B හා D ය |
| ii) B හා C ය | iv) C හා D ය |

38. තවාන් මිශ්‍රනය සැකසීමේ නිවැරදි අනුපිළිවෙල වනුයේ,

i) මතුපිට පස් හා වැලි ගෙන වෙන වෙනම හලා සම ප්‍රමාණ මිශ්‍ර කිරීමයි

ii) මතුපිට පස් හා දිරාපත් නොවූ කාබනික ද්‍රව්‍ය ගෙන සම ප්‍රමාණ මිශ්‍ර කිරීමයි.

iii) මතුපිට පස් හා වැලි සම ප්‍රමාණ මිශ්‍ර කර හලා ගැනීමයි.

iv) මතුපිට පස් හා කොම්පෝස්ට් වෙන වෙනම හලා සම ප්‍රමාණ මිශ්‍ර කිරීමයි